ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

<u>කොළඹ</u>

## <u>පුවත්පත් නිවේදනය</u>

### <u>ඉන්දු - ශ්‍රී ලංකා හමුදා සහෝදරත්වය දුරු දේශයන්හි සාමය දිනා දේ</u>

ඉන්දීය සහ ශ්‍රී ලංකා හමුදාවන් අතර පවතින සහෝදරත්වය සහ සමීප සහයෝගීතාවය දෙරටෙහි දේශසීමාවන්ගෙන් ඉතා ඈතින් පිහිටි රාජ්‍යයක දී පිළිඹිබු කරමින් දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුමට අනුයුක්ත ඉන්දියානු සාම සාධක භටයන් 135 දෙනෙක් සහ ශ්‍රී ලාංකික සාම සාධක භටයන් 103 දෙනෙක් ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් මෙම සතිය මුලදී බොර් නුවර දී එක්සත් ජාතීන්ගේ සාම සාධක බලකායේ අණ දෙන නිලධාරිතුමා අතින් පදක්කම් ලැබූහ. ඉන්දීය සහ ශ්‍රී ලංකා සාම සාධක භටයන්ගේ සේවාව අගය කරමින් එක්සත් ජාතීන්ගේ සාම සාධක බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් ජෙනරාල් ශයිලේෂ් ටිනයිකර් මහතා මෙම අභියෝගාත්මක පරිසරය තුළ දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුමෙහි රාජකාරීන් නිසි අයුරින් ඉටු කිරීම සඳහා ඔවුන් විසින් ලබා දුන් දායකත්වයට සිය සුබපැතුම් එක් කළේය.

2. මෙම සාම සාධක භටයන් විවිධ ජාතීන්ට අයත් හමුදා භට පිරිස් අතරින් තෝරා ගන්නා ලදී. ඉන්දියානු ජාතිකයන් 2418 දෙනෙකු සහ ශ්‍රී ලාංකිකයන් 686 දෙනෙකුගේ ඒකාබද්ධ පිරිස දකුණු සුඩානයේ සාම සාධක මෙහෙයුමෙහි සේවය කරන සමස්ත බලකායෙන් 20%කට වැඩි ප්‍රමාණයකි.

3. ඉන්දියානු සාම සාධක භටයෝ ප්‍රධාන වශයෙන්ම බෝර්, පිබෝර් යන ප්‍රදේශයන්හි ද අකෝබෝ හි තාවකාලික මෙහෙයුම් කඳවුරක ද සේවයේ අනුයුක්තව සිටිති. පදක්කම් දිනාගත් ශ්‍රී ලාංකික භටයන් බිලූ බෙරෙට්ස් ගුවන් ඒකකය නියෝජනය කරති. ඉන්දියානු සාම සාධක භටයන් දකුණු සුඩානයේ සංවේදී ප්‍රදේශයන්හි සේවය කරන අතර ඔවුන් දකුණු සුඩානයේ විවිධ ප්‍රදේශයන්හි හමුදා කඳවුරු වැනි සිවිල්-හමුදා සහයෝගිතාවයන් ඇතුළු විවිධ ක්‍රියාකාරකම් සඳහා දායක වී ඇත. පසුගිය කාලයේදී හෙලිකොප්ටර් දෙකක් බිම හෙළා තිබුණ ද ශ්‍රී ලංකා සාම සාධක භටයෝ තම අප්‍රතිහත සේවාව අඛණ්ඩව ලබා දෙති.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආරක්ෂක ක්ෂේත්‍රය තුළ සමීප සබඳතා පවතී. ශ්‍රී ලංකාව MV එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්න මැඩ පැවැත්වීමට සහ පරිසර දූෂණය පාලනය කිරීමට ඉන්දියාවෙන් සහය ඉල්ලා පැය කිහිපයක් ඇතුළත ඉන්දියානු රජය විසින් විවිධ නෞකා සහ ගුවන්යානා ශ්‍රී ලංකාවට එවන ලදී. කලාපය තුළ ඇති වන අර්බුදකාරී තත්වයන් හිදී “ප්‍රථම ප්‍රතිචාරකයා” වශයෙන් ඉන්දියාවේ භූමිකාව 2020 සැප්තැම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලද සාගර් ආරක්ෂා මෙහෙයුම I හි දී සහ 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ඇති වූ ගං වතුර තත්වයේ හිදි ද ප්‍රදර්ශනය විය.ආරක්ෂක ක්ෂේත්‍රය තුළ පවතින විවිධාකාර ද්විපාර්ශවික සබඳතා සමුද්‍රීය ආරක්ෂාව සහ ඒකාබද්ධ අභ්‍යාස වැනි නොයෙක් අංශ පුරා විහිදී පවතී.

*****

කොළඹ
2021 ජූනි 18